# තනතුරු ඇබෑර්තු

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල "ක්වාසි" තනතුරු සඳහා
ක්වාසි විනිසුරුවරුන් පත්කිරීම - 2025

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්හට මේ සඳහා අයදුම් කළ හැක.**

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥවරයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40 ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිත වූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙකු විය යුතුය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන්කොට **2025 අප්‍රේල් මස 30 වැනි දින** හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12,
2025 මාර්තු මස 28 වැනි දින.

**උපලේඛනය**

| | ක්වාසි අධිකරණය | ක්වාසි අධිකරණ කලාපය |
|---|---|---|
| 01 | බදුල්ල | බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය |
| 02 | බේරුවල | කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 03 | කොළඹ දකුණ | කොළඹ අධිකරණ කලාපයට අයත් කොම්පඤ්ඤ වීදිය, කුරුඳුවත්ත, කොල්ලුපිටිය, බම්බලපිටිය, හැව්ලොක් ටවුම, නාරාහේන්පිට, වැල්ලවත්ත සහ කිරුළපන යන අධිකරණ බල ප්‍රදේශ. |
| 04 | කාත්තන්කුඩි | මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනයිපත්තු උතුර සහ දකුණ, එරුවිල්, පෝරයිතීවු යන ආදායම් කොට්ඨාස. |
| 05 | මාතලේ | මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ අධිකරණ කලාපය |
| 06 | මාවනැල්ල | කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල අධිකරණ කලාපය |
| 07 | පුත්තලම සහ හලාවත | පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම සහ හලාවත අධිකරණ කලාපය. (කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හැර) |
| 08 | සමන්තුරේ | අම්පාර දිස්ත්‍රික්කයේ සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 01, 02, මල්ලම්පිටිය, නයිනාකාඩු, මල්වත්ත, නාවිදන්වේලි, අන්නයිවිලි කොට්ඨාසය |
| 09 | උඩතලවින්න (උඩ, මැද සහ පහත දුම්බර) | මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර, මැදදුම්බර සහ පහත දුම්බර ආදායම් කොට්ඨාසය |
| 10 | යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපය |